**මොරටුව මහා නගර සභාව**

මොරටුව මහා නගර සභාවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

(විවෘත පදනමින්)

මොරටුව මහා නගර සභාවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා (විවෘත පදනමින්) සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට පහත සුදුසුකම් ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. විදුලි කාර්මික III ශ්‍රේණියේ පුරප්පාඩු 01
2. ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණියේ පුරප්පාඩු 01

ඉහත තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව, මොරටුව යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරය වම්පස උඩ කෙළවරේ **" විදුලි කාර්මික / ආදාහනාගාර ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**2. බඳවා ගැනීමේ සුදුසුකම් :**

2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

2.2 අධ්‍යාපන සුදුසුකම් :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම. (මින් විෂයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතුයි.)

2.3 වෘත්තීය සුදුසුකම් :-

අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මඟින් සනාථ කළ යුතුය.)

2.4 පළපුරුද්ද :- අදාළ නොවේ.

2.5 කායික සුදුසුකම් :-

සෑම අයදුම්කරුවෙකුම අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

2.6 වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
III. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය
IV. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2.7 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

3. **බඳවා ගැනීමේ ක්‍රමය**

3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :<br>**අධ්‍යාපන සුදුසුකම් :**<br>බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ | 20 | 50% |
| සාමාන්‍ය සමාර්ථයට - ලකුණු - 04<br>සම්මාන සමාර්ථයට - ලකුණු - 06<br>අධි සම්මාන සමාර්ථයට - ලකුණු - 08<br>විශිෂ්ඨ සම්මානයට - ලකුණු - 10 | | |
| සාමාන්‍ය දැනීම :<br>ආර්ථික, සමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නාවූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් යුක්ත වේ. | 75 | |
| පෞරුෂත්වය<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම | 05 | |

**3.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-**

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.

4. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :

වැටුප් කේත අංකය : PL2 - 2025

වැටුප් පරිමාණය : 41800- 10x490 – 10x540 –10x 590 -12X 630 - 65560/-

5 . භාෂා ප්‍රවීණතාවය :

| | |
|---|---|
| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

6. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

III. මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කල පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට ද යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**07. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

I. අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට ප්‍රථම නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ " විදුලි කාර්මික / ආදාහනාගාර ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම " යනුවෙන් සඳහන් කළ යුතුය.

IV. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම් ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

**08. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍යය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

09. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීම සම්බන්ධයෙන් ද, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව ද තීරණය ගැනීමේ බලය මොරටුව මහා නගර සභාව සතු වේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

එල්.පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

2026 සැප්තැම්බර් මස 18 වන දින
මොරටුව මහා නගර සභාවේදීය.